මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.05. 17

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 (i)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්,

<u>ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022.08.22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. එම චක්‍රලේඛයේ විධිවිධාන සම්බන්ධයෙන් ඉදිරිපත් වන විමසීම් සැලකිල්ලට ගනිමින් ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් පහත සංශෝධන නිකුත් කරනු ලැබේ.

3. විධිමත් අනුමැතිය යටතේ විදේශගතව සිට දිවයිනට පැමිණ නැවත සේවයේ යෙදෙන රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන් සඳහා ද මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව වැටුප් රහිත නිවාඩු ලබා ගත හැකිය.

3.1. වැටුප් රහිත නිවාඩු / වැටුප් සහිත නිවාඩු / රජයේ හෝ ආයතනයේ වියදමින් ලද පුහුණුවක් ලබා ගෙන එයට අදාළ අනිවාර්යය සේවා කාලයකට/ ගිවිසුම්ගත සේවා කාලයකට යටත්ව සිටින නිලධරයන්ට මෙම චක්‍රලේඛයට අනුව විදේශ නිවාඩු ලබා ගත හැකි වනුයේ අනිවාර්යය සේවා කාලයෙන්/ ගිවිසුම්ගත සේවා කාලයෙන් අඩක් හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීමෙන් පසුවය. කෙසේ වෙතත්, අදාල සේවකයා නැවත ලංකාවට පැමිණි පසු සේවයෙන් විශ්‍රාම යාමට පෙර අනිවාර්ය සේවා කාලය /ගිවිසුම්ගත සේවා කාලය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් සේවා කාලයක් පැවතිය යුතු අතර එසේ කිරීමට අනිවාර්යෙන්ම සේවකයා බැඳී සිටිය යුතුය.

4. කෙසේ වුවද, මෙම චක්‍රලේඛ විධිවිධාන හෝ වෙනත් ඕනෑම විධිවිධානයක් යටතේ රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයෙකු හට වැටුප් රහිත විදේශ නිවාඩු ලබා දීමේ හැකියාව පවතිනුයේ එම සේවකයාගේ සම්පූර්ණ සේවා කාලය තුළ උපරිම අවුරුදු 5ක කාලසීමාවක් සඳහා පමණි.

5. තවද, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 හි සඳහන් විධිවිධාන තවදුරටත් නොවෙනස්ව පවතී.

6. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන අංක 011-2484627 මඟින් රාජ්‍ය ව්‍යාපාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසිය යුතුය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන

භාණ්ඩාගාර ලේකම්